ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය
**මාර්තු 2017**

# ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

**සංඛ්‍යාන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව**

නිෂ්පාදන සහ සේවා කටයුතු වලට අදාල ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක සමීක්ෂණයෙහි ප්‍රතිඵල

වැදගත් කරුණු:

- **නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** 2017 මාර්තු මාසයේ දී 66.5 ක දර්ශක අගයක් වාර්තා කරමින් 2017 පෙබරවාරි මාසයට සාපේක්ෂව දර්ශක අගයයන් 9.4 කින් ඉහළ යන ලදී. මෙම ඉහළ යෑම තුළින්, මාර්තු මාසයේ දී ද නිෂ්පාදන ක්‍රියාකාරකම්හි අඛණ්ඩ වර්ධනය පිළිඹිබු වන අතර, මේ සඳහා අලුත් අවුරුදු උත්සව සමයෙහි ඇතිවන ඉල්ලුමෙහි වර්ධනය සහ ඊට අනුරූප නිෂ්පාදන කටයුතුවල ඉහළ යෑම පිළිඹිබු කරමින්, නව ඇණවුම් සහ නිෂ්පාදන උප දර්ශක වර්ධනය විය. මේ අතර, පසුගිය මාසය තුළ ඇති වූ භාණ්ඩ තොග ලැබීමේ වූ ප්‍රමාදය යථා තත්ත්වයට පත්වීම සහ භාණ්ඩ තොග රැස්කරගැනීම හේතුවෙන්, ගැනුම් තොග උප දර්ශකය ඉහළ යන ලදී. කෙසේ වුවද, ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය යන උප දර්ශකය පහත වැටුණි. මේ සඳහා, චීනයේ නව අවුරුදු උත්සව සමය අවසන් වීමත් සමඟ සැපයුම් සාමාන්‍ය පරිදි ලැබීම විශේෂයෙන්ම හේතු විය. තවද, සේවා නියුක්ති උප දර්ශකය සුළු වශයෙන් පහත වැටුණි. මෙහි දී සියලුම උප දර්ශක කඩඉම් මට්ටම ලෙස ගැනෙන දර්ශක අගය වන 50.0 ට වඩා වැඩි අගයක් වාර්තා කරන ලදී. මේ අතර, ඉදිරි මාස තුන සඳහා ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳ අපේක්ෂාවන් හි වර්ධනයෙහි මන්දගාමීත්වයක් පෙන්නුම් කරන ලදී.

- **සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** 2017 පෙබරවාරි මාසයේ දී වාර්තා වූ 57.3 ක දර්ශක අගයක සිට මාර්තු මාසයේ දී 60.8 ක දර්ශක අගයක් වාර්තා කරන ලදී. පසුගිය මාසයට සාපේක්ෂව ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකයෙහි සිදු වූ මෙම ඉහළ යෑමෙන් 2017 මාර්තු මාසයේ දී සේවා අංශයෙහි ආර්ථික ක්‍රියාකාරකම් පසුගිය මාසයට සාපේක්ෂව වැඩි වේගයකින් වර්ධනය වූ බව පෙන්නුම් කරයි. නව ව්‍යාපාර සහ ව්‍යාපාර ක්‍රියාකාරකම් වර්ධනයන් සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකයෙහි සිදු වූ වර්ධනයට ආධාර විය. 2017 පෙබරවාරි මාසය හා සැසඳීමේ දී මාර්තු මාසයේ දී සේවා නියුක්ති සහ අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම් අඩු වේගයකින් වර්ධනය වූ අතර නිම කිරීමට ඇති කාර්යයන් අඩු වේගයකින් පහත වැටුණි. අය කරන මිල ගණන් (ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය ගණනය කිරීමේ දී සලකා නොබලන) 2017 මාර්තු මාසයේ දී පසුගිය මාසයට සාපේක්ෂව අඩු වේගයකින් ඉහළ යන ලදී. තවද, ශ්‍රම පිරිවැය පිළිබඳ අපේක්ෂා මගින් මනිනු ලබන ඉදිරි ශ්‍රම පිරිවැය, 2017 මාර්තු මාසයේ දී ඉහළ යන ලදී.

| | ව\මා | ජන. | පෙබ. | මාර්. | අප්‍රේ. | මැයි | ජුනි | ජූලි | අගෝ. | සැප්. | ඔක්. | නොවැ. | දෙසැ. |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **2015** | n.a. | n.a. | n.a. | n.a. | 67.3 | 57.5 | 55.5 | 56.5 | 53.2 | 57.8 | 54.8 | 57.9 |
| | **2016** | 51.9 | 55.3 | 60.7 | 41.6 | 47.9 | 55.1 | 50.6 | 53.5 | 57.7 | 56.5 | 58.4 | 58.3 |
| | **2017** | 56.2 | 57.1 | 66.5 | - | - | - | - | - | - | - | - | - |
| **සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **2015** | n.a. | n.a. | n.a. | n.a. | 66.8 | 65.0 | 60.6 | 59.8 | 61.7 | 59.5 | 59.3 | 60.2 |
| | **2016** | 58.0 | 59.3 | 61.6 | 54.7 | 58.1 | 56.3 | 57.8 | 61.2 | 57.7 | 59.3 | 59.7 | 59.8 |
| | **2017** | 57.5 | 57.3 | 60.8 | - | - | - | - | - | - | - | - | - |

## නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




## සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය



තාක්ෂණික සටහන:

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව අවම වශයෙන් ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමු ද්‍රව්‍යය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිමකිරීමට නියමිත කාර්යයන් | : ව්‍යාපාරික ක්‍රියාකාරකම් ඉහළයාම හේතුවෙන් නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.